පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.29 පැය 1525 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1904 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**විශේෂ රථවාහන මෙහෙයුම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

උත්සව සමයේ රථවාහන අනතුරු අවම කර ගැනීමේ අරමුණින් වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ රථවාහන මෙහෙයුමක් 2024.12.23 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

2024.12.28 වන දින පැය 0600 සිට 2024.12.29 වන අද දින පැය 0600 න් අවසන් වූ පැය 24 ක කාලය තුල විශේෂ රථවාහන මෙහෙයුම මඟින් බීමත් රියදුරන් 401 දෙනෙකු, අපරීක්ෂාකාරී හා අන්තරාදායක ලෙස රිය පැදවීමට අදාල රියදුරන් 53 දෙනෙකු, අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධව රියදුරන් 48 දෙනෙකු, මාර්ග නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් රියදුරන් 1350 ක්, බලපත්‍ර වැරදි සම්බන්ධ රියදුරන් 865 ක් සහ වෙනත් රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 5351 ක් වශයෙන් සමස්ත රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 8068 ක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇත.

මෙම විශේෂ මෙහෙයුම තවදුරටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන අතර බීමත්ව රිය ධාවනය නොකිරීමටත්, මාර්ග නීති උල්ලංඝණය ඇතුළු අනෙකුත් රථවාහන නීතී රීති උල්ලංඝණය නොකරන ලෙසටත් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**